## පළමුවන කියැවීම

සෙකරියා 12:10-11

සෙකරියා දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

**"ඔව්හු ඇන තුවාළ කරන ලද්දා වූ තැනැත්තා දෙස බලන්නෝ ය."**

"මම දාවිත්ගේ වංශයට ද ජෙරුසලමේ සෙනඟට ද කරුණාවේ හා අයැදීමේ සිතක් දෙන්නෙමි. ඔව්හු තමන් විසින් ඇන තුවාළ කරන ලද්දා වූ තැනැත්තා දෙස බලා, නැති වූ එක ම පුත්‍රයා ගැන වැලපෙන අය මෙන් වැලපෙන්නෝ ය; එක ම පුත්‍රයා ගැන ශෝක වන්නාක් මෙන් ශෝක වන්නෝ ය. ඒ කාලයේ දී මෙගිද්දෝ සමභූමියෙහි දී හදද්රිම්මොන් ගැන වැලපෙන්නාක් මෙන් ජෙරුසලමේ වැලපීම මහත් වන්නේ ය."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 63:1-5, 7-8

පිළිතුර: සමිඳුනි, අප හදවත් ඔබ කෙරෙහි පිපාසයෙන් පෙළෙන්නෝ ය.

ගීය: දෙවිඳුනි, මාගේ දෙවිඳුනි, ඇඩි ආශාවෙන් මම ඔබ සොයන්නෙමි. මා හද ඉතා ගිජු ලෙස ඔබ කෙරෙහි පිපාසයෙන් පෙළෙන්නේ ය. වියළි බිම ජලයට පිපාසා වන පරිදි මම ඉතා ආශාවෙන් ඔබ වෙත ඇදී යන්නෙමි.

ඔබේ ශුද්ධස්ථානයේ දී මම ඔබ දෙස ඕනෑකමින් බලා සිටින්නෙමි. ඔබේ බලය ද මහිමාලංකාරය ද නරඹන්නෙමි. ඔබේ තිර පෙම මාගේ ජීවිතයටත් වඩා මට අගනේ ය; මාගේ මුව ඔබට ප්‍රශංසා කරන්නේ ය.

මුළු ජීවිතයේ දී ම මම ඔබට ප්‍රශංසා කරන්නෙමි; ඔබේ නාමයෙන් අයැදිමින් මම ඔබ දෙසට දෑත නගන්නෙමි. රස මස්වුලින් මෙන් මම සෑහීමට පත් වන්නෙමි; මා මුවින් තුති ගී ගයා මම ඔබ පසසන්නෙමි.

මන්ද, ඔබ වහන්සේ මාගේ ආධාරය වූ සේක. ඔබේ පියාපත් සෙවණෙහි මම ප්‍රීති වන්නෙමි. ම සිතෙහි ඔබ කෙරෙහි තද ඇල්මක් ඇත; ඔබ දකුණතින් මා උසුලන සේක.

## දෙවන කියැවීම

ගලාති 3:26-29

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් ගලාතිවරුන්ට ලියන ලද හසුනෙන් උපුටාගත් කොටසකි.

**"ක්‍රිස්තුන් වහන්සේ තුළ බව්තීස්ම-ස්නාපනය ලැබූවෝ උන්වහන්සේගේ ජීවිතයෙන් සැරසී සිටිති."**

ඔබ සියල්ලෝ ම ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ ඇදහිල්ල කරණකොටගෙන දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ ය. ඔබ අතරෙන් ක්‍රිස්තුන් වහන්සේගේ නාමයට බව්තීස්ම-ස්නාපනය කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයෙන් සැරසී සිටිති. ඔබ සියල්ලන් ක්‍රිස්තුස් ජේසුස් වහන්සේ තුළ එක් කෙනෙකු මෙන් සිටින නිසා, ජුදෙව්-ග්‍රීක භේදය වත්, දස-නිර්දස භේදය වත්, ස්ත්‍රී-පුරුෂ භේදය වත් නැත. ඔබ ක්‍රිස්තුන් වහන්සේට අයිති නම්, ඔබ ආබ්‍රහම්ගේ වංශයට අයිති ව, පොරොන්දුව ලෙස උරුමක්කාරයෝ ද වන්නහු ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සාධුකාරය

ජුවාම් 8:12

ආලේලූයා! ආලේලූයා!
"ලෝකයේ ආලෝකය මම ය; මා අනුගාමී වන්නා අඳුරෙහි නොහැසිර
ජීවනයේ ආලෝකය ලබන්නේ ය"යි සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

ලූක් 9:18-24

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය."**

ජේසුස් වහන්සේ තනියම යාච්ඤා කරද්දී ශ්‍රාවකයෝ උන් වහන්සේ සමඟ සිටියහ. එවිට උන් වහන්සේ, "මහජනයා මා කවරෙකැ යි කියද්ද"යි ඔවුන්ගෙන් ඇසූ සේක. ඔව්හු, "සමහරු 'ස්නාවක ජුවාම්' ය කියාත් සමහරු 'එලියා' කියාත් අන් සමහරු, 'ආදියෙහි සිටි දිවැසිවරයන්ගෙන් කෙනෙක් නැවත උත්ථාන වී ය' කියාත් කියති"යි පිළිතුරු දුන්හ. "එහෙත්, ඔබ මා කවරෙකු කියා කියන්නහු ද"යි උන් වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. "ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය"යි පේදුරු පිළිතුරු දුන්නේ ය. උන් වහන්සේ මෙය කිසිවෙකුට නොකියන ලෙස ඔවුන්ට තදින් අණ දුන් සේක. තවද, "මනුෂ්‍ය-පුත්‍රයාණන් බොහෝ දුක් වේදනා විඳින්නටත්, ප්‍රජා මූලිකයන් ද නායක පූජකවරයන් ද විනයධරයන් ද විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්න හා මරනු ලබන්නටත් තෙ වන දින මරණින් උත්ථාන කරනු ලබන්නටත් නියම ව ඇතැ"යි වදාළ සේක. ජේසුස් වහන්සේ සියල්ලන්ට කතා කොට, "යමෙක් මා අනුව එන්න කැමැත්තේ ද, ඔහු තමකම නසා, දිනපතා සිය කුරුසිය දරාගෙන මා අනුව ආවා වේ. සිය ජීවිතය රැක ගන්න කැමැති යමෙක් වේ ද, ඔහු එය නැති කරගනියි; මා නිසා සිය ජීවිතය නැති කරගන්න යමෙක් වේ ද ඔහු එය රැකගනී ය"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.com/ වෙත පිවිසෙන්න.